*සැ. යු.* - මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2008 වර්ෂයේ අප්‍රේල්- ජුනි කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත්ති යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,762 - 2012 ජුනි 08 වැනි සිකුරාදා - 2012.06.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 908 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1000 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - (i) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) හිස්බුල්ලාහ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) දක්ෂිණ ලංකා තෘතියික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අප්‍රේල් මස 20 වැනි දින*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජුනි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජුනි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## මාතර මහ නගර සභාව

මාතර මහ නගර සභාවේ කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය සඳහා පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

| *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතනගත රියැදුරු III පන්තිය | 04 | රා.ප.ච. 6/2006 (iv) අනුව PL-3-2006A රු. 12,470 -10x130-10x145 - 10x160 - 12 x 170 - රු. 18,860 | **අධ්‍යාපන සුදුසුකම්**<br>දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ ඕනෑම විෂයයන් 06ක් සමත්වී තිබීම.<br><br>**ශිල්පීය නිපුණතා ප්‍රවීණතා සුදුසුකම්**<br>පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගයෙහි රියැදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. මෝටර් රථ රියදුරන් රියැදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. |
| මුරකරු III පන්තිය | 02 | රා.ප.ච. 6/2006 (iv) අනුව PL-1-2006 හි 12 වැනි වැටුප් පියවර වන රු. 13,060 -130x14-14,880 | අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත්ව තිබීම. |

*පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය ;
(ii) අයදුම්කරු මාතර මහ නගර සභා බල ප්‍රදේශය තුළ අනුගාමී වසර 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.) (මාතර මහ නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක /තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ අයදුම්කරුවන්ට පමණක් මාතර බල ප්‍රදේශයේ පදිංචිවීම අනිවාර්ය නොවේ.) ;
(iii) මාතර මහ නගර සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ;
(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය ;
(v) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ. එහෙත් එම තනතුරට බඳවා ගන්නා දිනට උපරිම වයස ඉක්මවා නොතිබිය යුතුයි. රියැදුරු තනතුර සඳහා ස්ථිර තනතුරක සිටින අභ්‍යන්තර අයදුම්කරුවකුට පමණක් උපරිම වයස් සීමාව අදාළ නොවේ.) ;
(vi) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.;

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා රියැදුරු තනතුර සඳහා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ;
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයන්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම රියැදුරු තනතුර සඳහා පරිවාස කාලය අවසානයේ දී පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත්ව තිබේ නම් පමණක් සේවයේ ස්ථිර කරනු ඇත.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.
(V) රියදුරු තනතුරු සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතනගත මෝටර් රථ රියැදුරන් සඳහා වන රියැදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම් අනුව උසස්වීම් හිමි වනු ඇත.

*ඉල්ලුම්කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2012.06.29 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ

වම්පස ඉහළ කෙළවරේ "කම්කරු තනතුර (කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය සඳහා)" යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මාතර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබියයුතුය);
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
(v) පළපුරුද්ද පිළිබඳ සහතික ;
(vi) මාතර මහ නගර සභාවේ කසළ ප්‍රතිචක්‍රීයකරණය ව්‍යාපෘතියේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

රංජිත් යාපා,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව - මාතර.

2012 මැයි මස 17 දින,
මහා නගර සභාව - මාතර.

*කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ රියැදුරු/මුරකරු තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————.
3. තැපැල් ලිපිනය :——————————.
4. උපන් දිනය : අවුරුද්ද :————, මාසය :————, දිනය :————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————,` මාස :————, දින :————,
7. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
8. විවාහක/අවිවාහක බව :——————————.
9. ජාතිය :——————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන්ද යන වග :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් :——————————.
12. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————.
13. ඔබ දැනටමත් මාතර මහ නගර සභාවේ කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ සේවය කරන්නේ නම් :——————————.
    (i) දැනට දරන තනතුර :——————————.
    (ii) එම තනතුරට පත්වූ දිනය :——————————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ ඇස්තමේන්තුගත පදනම මත ද) :——————————
.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන තොරතුරු සත්‍ය වූත් හා නිවැරදිවූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

06-223

---

**හොරණ නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

අයදුම්පත් භාරගන්නා දිනය දීර්ඝ කිරීම

හොරණ නගර සභාවේ තනතුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2012.05.11 දින ගැසට් පත්‍රයේ පළාත් සභා කොටසේ පළකරන ලද නිවේදනය අනුව අදාල අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2012.06.13 දින දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් දන්වමි.

පී. ජී. පී. රුදිගෝ,
ලේකම්,
නගර සභාව - හොරණ.

2012 මැයි 18 වන දින,
හොරණ නගර සභා කාර්යාලයේ දී ය.

06-259

# පළාත් පාලන නිවේදන

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්ති ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් වලට අදාල ඉඩම් වල හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරෝධතාවයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්ති ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. එම්. බන්දුල සෙනවිරත්න,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙළිඔය,
2012 පෙබරවාරි මස 27 වෙනි දින,

### උපලේඛනය

| | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස ඉඩම් හිමිකරුවන්* | *දකුණුපස ඉඩම් හිමිකරුවන්* | *දිග* | *පළල* |
|---|---|---|---|---|---|---|---|
| 1. | ජය මාවත | හුමානවත්ත ප්‍රධාන මාර්ගයේ වාසනා වෙළඳ සැල අසළ | හුමානවත්ත ප්‍රධාන මාර්ගය පිට්ටනිය අසල | ඩබ්. විමලාවතී<br>ආර්. ජී. අනුලාවතී<br>දිවලේ ගෙදර ලැයිසා | එස්. එන්. අකුරන්දෙණිය<br>එස්. එම්. සීතා කුමාරි<br>කේ. යූ. උපාලි මුණසිංහ<br>පූජ්‍ය දොයවේ විමලරත්න හිමි, ශ්‍රී ශාසනෝදය පිරිවෙන<br>ටී. ජී. සුනිල් ශාන්ත | අඩි 300 0 | අඩි 8 0 |
| 2. | කොට්ටුන්න හේන සමගි මාවත | ඩී. බී. විජේතුංග ප්‍රජා ශාලාව, පොල්ගහඅංග | කොට්ටුන්නහේනගම | කොට්ටුන්නහේන<br>ඩබ්. එම්. අයි. බණ්ඩාර<br>ඩබ්. එම්. මද්දුම බණ්ඩාර<br>ජේ. එම්. විජේතුංග<br>එච්. එම්. සෙනෙවි රත්න | එම්. එම්. එල්. මුරුද්දෙනිය<br>ආර්. එම්. පී. එස්. බංඩාර<br>ජී. මද්දුම බණ්ඩාර<br>එම්. එම්. වී. එම්. මුද්දෙනිය<br>කේ. එම්. ආර්. ටී. සමරකෝන් | අඩි 560 | අඩි 8 0 |
| 3. | හන්දෙස්ස තැන්නේ වත්ත පාර | හන්දෙස්ස නාරංවල පාර | ඩබ්. ජී. මහින්දපාල මහතාගේ ගාන අංක 6 2/4 දරන නිවස අසල | එච්. බී. ආර්. එන්. වීරසිංහ<br>එම්. ජී. සුමනාවතී<br>එම්. ජී. ආනන්ද<br>එච්. පී. පී. කැලුම් ධර්මරත්න | කේ. ඒ. යූ. කරුණාරත්න<br>ඩී. ජී. ධම්මිකා කුමාරි<br>ඩී. ජී. පියසීලි<br>කේ. ඒ. සී. කස්තුරිආරච්චි<br>ඩබ්. ජී. එන්. සමරසිංහ | අඩි 270 | අඩි 5 0 |
| 4. | යාලේගොඩ බුලුගහයට හේන පාර | ගොඩගන්දෙණිය බෝක්කුව අසලින් | පී. විල්බට් මහතාගේ නිවස අසලින් | සන්ජීව නුවන් පතිරණ<br>බුලුගහමුලහේන<br>ඩී. එම්. ගුණරත්න බණ්ඩා<br>බුලුගහයට හේන<br>ඒ. ශ්‍රියාකාන්ති - බුලුගහයටහේන | ඒ. රත්නබණ්ඩා<br>වයි. එම්. ජී. රම්‍යාකුමාරි<br>බුලුගහයටහේන<br>පී. විල්බට් - බුලුගහයටහේන | අඩි 478 0 | අඩි 8 0 |

06-332

## සීතාවකපුර නගර සභාව

### නගර සභා ආඥා පනත - 255 වැනි අධිකාරිය

2012 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු සහ කර්මාන්ත බදු පැනවීම

සීතාවකපුර නගර සභාව විසින් 2011 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 5:1:1 යටතේ පනවනු ලැබූ යෝජනාව, 2012 පෙබරවාරි මස 09 වැනි දින පැවති සභාව විසින් පහත පරිදි සංශෝධනය කරනු ලැබූ අතර, ඒ අනුව එම 2011.11.18 දින ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු කර්මාන්ත බදු අය කිරීමේ නිවේදනය මේ මගින් අවලංගු කරන අතර එය පහත පරිදි නිවැරදි කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීතාවකපුර නගර සභාව විසින් නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 162 හා 1979 අංක 42 සහ 1985 අංක 20 දරන මහ නගර සභා සහ නගර සභා (සංශෝධිත) පනත් වලින් සංශෝධිත එකී නගර සභා ආඥා පනතේ 164, 165 (අ) සහ 165 (ආ) යටතේ සීතාවකපුර නගර සභා පාලන සීමාව තුළ පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයන්හි සඳහන් වෙළඳ ව්‍යාපාර වෙනුවෙන්, බලපත්‍ර ගාස්තු, ව්‍යාපාර බදු, කර්මාන්ත බදු 2012 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2010.02.09 වැනි දින පැවති මහ සභා තීරණ අංක 5.1.3 පරිදි තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2012 වර්ෂයේ බලපත්‍ර ගාස්තු ව්‍යාපාර බදු, කර්මාන්ත බදු, 2012 ජූලි මස 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු ය.

ආර්. එම්. එස්. පේමලාල් පිංතු
සභාපති,
සීතාවකපුර නගර සභාව,
අවිස්සාවේල්ල.

2012 මැයි මස 22 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය.

### 1 වැනි උපලේඛනය - බලපත්‍ර ගාස්තු

1. තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම
2. බේකරියක් පවත්වාගෙන යාම
3. ග්‍රොස් 01 කට වැඩිප්‍රමාණයක් සිසිල්බීම ගබඩා කිරීම
4. ගැලුම් 50 කට වැඩිප්‍රමාණයක් පොල්තෙල් ගබඩාකර තබා ගැනීම
5. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
6. යන්ත්‍රෝපකරණ පාවිච්චිකරන කම්හලක් පවත්වාගෙන යාම
7. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
8. රබර් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
9. නරක්වන සුලු ආහාර ද්‍රව්‍ය මෙ. ටො. 01 කට වඩා ගබඩා කර තබා ගැනීම
10. දුම්කොළ ගබඩා කිරීමේ හෝ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11. කරවල, ලුණු, මාළු, ජාඩි කි. 50 කට වැඩි ප්‍රමාණයක් වෙළදාම පිණිස ගබඩාකර තබා ගැනීම
12. සත්ව ආහාර ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
13. ගෘහ භාණ්ඩ නිපදවීමේ හෝ ගෘහ භාණ්ඩ වෙළඳසැලක් පවත්වාගෙන යාම
14. පරණ ලෝහ භාණ්ඩ ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
15. වඩු මඩුවක් පවත්වාගෙන යාම
16. හුණු ගබඩාවක් පවත්වාගෙන යාම
17. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් කි. ග්‍රෑ. 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
18. යන්ත්‍රානුසාරයෙන් කෝපි, ධාන්‍ය මාංශ භෝග, මිරිස්කුඩු හෝ පිටි ඇඹරීම පිණිස ස්ථානයක් පවත්වාගෙන යාම
19. ටයර් ටියුබ් වෝල්කනයිසිං කිරීමේ ස්ථානයන් පැවැත්වීම
20. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම (ස්ටුඩියෝ/ඡායාරූප මුද්‍රණ ස්ථානයක්)
21. බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
22. ඩ්‍රයික්ලීන් කරන හෝ ඇඳුම් පිරිසිදු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
23. මෝටර් රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
24. වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම
25. විදුලි වැඩපලක් පවත්වාගෙන යාම
26. ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
27. කොණ්ඩා කපන ස්ථානයක් පවත්වාගෙන යාම
28. අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
30. මෝටර් සයිකල් හා පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31. භෝජන ශාලාවක් (හෝටලයක්) පවත්වාගෙන යාම (ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නොකළ)
32. සම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33. ඌරන් 5කට වඩා ඇති මඩුවක් හෝ ගාලක් පැවැත්වීම
34. සිමෙන්ති මෙ. ටො. 01කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
35. ඇසිඩ් වර්ග නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36. කිරිපට්ටියක් පවත්වාගෙන යාම (කිරි එළදෙනුන් 04කට වැඩි)
37. කිකිළියන් හෝ කුකුළන් 100කට වැඩි ගණනක් සඳහා මඩුවක් පවත්වාගෙන යාම
38. සබන් නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. බීඩි හෝ සුරුට්ටු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40. උළු හෝ ගඩොල් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41. මෝටර් රථ අලුත්වැඩියාවට අමතරව සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
42. යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම
43. හිස්බෝතල් ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44. කොම්පෝස්ට් හෝ කෘත්‍රිම පොහොර නිෂ්පාදනය කිරීම
45. රබර් බඩු නිෂ්පාදනය කිරීම
46. යකඩ ගබඩාවක් පවත්වාගෙන යාම
47. ශීතකළ කුකුල් මස් හෝ මාලු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. යෝගට් නිෂ්පාදනය
49. යාන්ත්‍රිකව කළුගල් ඇඹරීම
50. පරණ යකඩ සණීකරණය කිරීම
51. බයිසිකල් (පාපැදි/යතුරුපැදි) අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. (ග්‍රැනයිට්) කළුගල් නිෂ්පාදනය
53. බටහිර ඖෂධ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
54. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
55. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
56. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීම
57. ශීතකරණ හෝ වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම

58. අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. කි. ග්‍රෑ. 50කට වැඩිවන තේ ප්‍රමාණයක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. තේ කොළ (කුඩු) පැකට් කර බෙදා හැරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. බිම්මල් නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
62. පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
63. මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. පරිඝණක අකුරු ඇමිණීම සහ මුද්‍රණය
65. ඡායාරූප තාක්ෂණික සැලසුම්කරණය හා නිර්මාණය
66. පරිඝණක මෘදුකාංග දෘඩාංග පද්ධති අලුත්වැඩියා කිරීම
67. මැණික්ගල් ඔපදැමීමේ හා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
68. ඉදල් හෝ මුස්න (කොහු) නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. ආහාර පාන සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (කේටරින් සර්විස්)
70. යන්ත්‍රෝපකරණ භාවිතා කර ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
71. යන්ත්‍රානුසාරයෙන් කලුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72. ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම
73. අවමංගල්‍ය කටයුතු සිදු කරන මල් ශාලාවක් පවත්වාගෙන යාම
74. වතුර බෝතල් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
75. පොලිතීන් නිෂ්පාදන අලෙවි කිරීම
76. ගල් ස්මාරක සාදන ස්ථානයක් පවත්වාගෙන යාම
77. කැවිලි වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
78. විසිතුරු පින්තාරු (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
79. බෙලෙක් වැඩ පලක් පවත්වාගෙන යාම
80. තොග වශයෙන් විකිණීම සඳහා සීනි, පිටි හෝ ලුණු කි. ග්‍රෑම් 750 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම
81. බේකරි නිෂ්පාදන (පාන්, බනිස්, පේස්ට්‍රි ආදිය) වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. ගෑස් පුරවන ලද සිලින්ඩර් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. සුලු කෑම නිෂ්පාදනය (රෝල්ස්, කට්ලට්, පැටිස් වඩේ ආදිය)
84. නේවාසිකාගාර පහසුකම් ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
85. ධාන්‍ය හෝ මාංශ භෝග කි. ග්‍රෑ. 250කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
86. අලුත් හෝ පාවිච්චි කරන ලද ටයර්, ටියුබ් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. අත්යන්ත්‍ර නොවන යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. ආගන්තුක නිවාසයක් (ගෙස්ට්හවුස් එකක්) පවත්වාගෙන යාම
89. රබර් මිශ්‍ර කොහු මෙට්ට නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90. රබර් දුම්ගෙයක් පවත්වාගෙන යාම
91. කිරිහලක් පවත්වාගෙන යාම
92. ඔසු පැන් හලක් පවත්වාගෙන යාම
93. ත්‍රීරෝද රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම

II වන උපලේඛනය - (ව්‍යාපාර බදු)

1. ගුවන් විදුලි යන්ත්‍ර ටේප් රෙකෝඩර් ටෙලිවිෂන් වෙළඳාම
2. සාප්පු බඩු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3. රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම
4. රසකැවිලි හෝ පළතුරු වෙළඳසැලක් පවත්වාගෙන යාම
5. සම්භාණ්ඩ වෙළඳසැලක් පවත්වාගෙන යාම
6. මෝටර් රථ අමතර කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
7. විද්‍යුත් උපකරණ (රූපවාහිනී, රේඩියෝ) අමතර කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
8. ඇලුමිනියම් භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
9. යකඩ බඩු කඩයක් පවත්වාගෙන යාම
10. පාවහන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11. සිල්ලර බඩු කඩයක් පවත්වාගෙන යාම
12. මහන මැෂින් වෙළඳසැලක් පවත්වාගෙන යාම
13. බයිසිකල් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
14. මහන මැෂින් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
15. ස්වර්ණාභරණ වෙළඳසැලක් පවත්වාගෙන යාම
16. ආයුර්වේද බෙහෙත් බඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
17. ලිපිද්‍රව්‍ය වෙළඳසැලක් පවත්වාගෙන යාම
18. පොත්පත් සාප්පුවක් පවත්වාගෙන යාම
19. නියෝජ්‍ය වෙළඳ ආයතනයක් පවත්වාගෙන යාම
20. අයිස්ක්‍රීම්, පැණිබීම හෝ සිසිල්බීම වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
21. එළවළු වෙළඳසැලක් පවත්වාගෙන යාම
22. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
23. මැටි භාජන වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
24. බුලත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
25. විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26. මල්ශාලාවක් පවත්වාගෙන යාම (උත්සව සඳහා මල් සැකසීමේ ස්ථානයක්)
27. ඇස්කණ්නාඩි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
28. මැණික් මිල දී ගැනීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
30. මෝටර් සයිකල් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
31. ඡායාස්ථ පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
33. පුවත්පත් හෝ සඟරා වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
34. ටින්කෑම වර්ග හෝ කිරි ආහාර වර්ග වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
35. මසා නිමකළ ඇඳුම් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
36. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
37. ක්‍රීඩා භාණ්ඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
38. සෙල්ලම්බඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
39. ලොතරැයි අලෙවිහලක් පවත්වාගෙන යාම
40. ඔරලෝසු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
41. ගීත පටිගත කරන හෝ තැටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම
42. බයිසිකල් අමතර කොටස් වෙළඳාම
43. මදුරු දැල් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
44. විද්‍යුත් මාධ්‍ය උපයෝගීකර නොගනිමින් තුරඟ තරග ක්‍රීඩාවක් පැවැත්වීම
45. විද්‍යුත් මාධ්‍ය උපයෝගීකරගනිමින් තුරඟ තරග ක්‍රීඩාවක් පැවැත්වීම
46. ඒජන්සි තැපැල් හලක් පවත්වාගෙන යාම
47. දේශීය, විදේශීය දුරකථන හා ෆැක්ස් සේවා ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

48. කිරිපිටි ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. පළතුරු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
50. චොක්ලට් ටොෆි වර්ග තොග වශයෙන් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
51. සංගීත භාණ්ඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
52. වීදුරු තහඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
53. කැසට්පටි හෝ වීඩියෝපටි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
54. පිගන් භාණ්ඩ අලෙවි කිරීමේ හා මුද්‍රණයකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. වීඩියෝ පටි, වීඩියෝ තැටි කුලියට දීම
56. වෙළඳ දැන්වීම් නිර්මාණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. උත්සව භාණ්ඩ කුලියට දීම සහ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. දුරකථන කුටියක් පවත්වාගෙන යාම
59. කඩල පරිප්පු, රටකජු හා වෙනත් ධාන්‍ය මුරුක්කු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. පොරි නිෂ්පාදනය හා අලෙවිය
61. සෙලියුලර් දුරකථන විකිණීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. විදුලි උපකරණ අමතර කොටස් විකිණීම
63. රබර් මිලදී ගැනීම හා විකිණීම
64. කරවල විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
65. මෙරට හා ආනයනික බීම වර්ග අලෙවි කිරීම
66. ත්‍රීරෝද රථ අමතර කොටස් වෙළඳාම
67. බෑග් අලෙවි කිරීම
68. කැබලි රෙදි අලෙවි කිරීම
69. පොල් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
70. ටයර් සහ ටියුබ් අලෙවිකිරීම
71. මෝටර් රථ බැටරි අලෙවි කිරීම සහ අලුත්වැඩියා කිරීම
72. රසායනික ද්‍රව්‍ය (කෘෂි රසායනික හා අනිකුත්) අලෙවිකිරීම හා ගබඩා කිරීම
73. ශබ්දවාහිනී යන්ත්‍ර කුලියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
74. සුභපැතුම්පත් අලෙවිකිරීම
75. වීදුරු භාණ්ඩ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76. කුළුබඩු පැකට් කර විකිණීම
77. ෆ්ලෝටයිල් , වෝල්ටයිල් හා විවිධ සෙරමික් භාණ්ඩ අලෙවි කිරීම
78. මෝටර රථ අමතර කොටස් නොවන මෝටර් රථවලට අදාල උපකරණ අලෙවි කිරීම
79. සනීපාරක්ෂක භාණ්ඩ අලෙවි කිරීම
80. දුම්වැටි තොග අලෙවිකිරීම
81. ෆ්ලයිවුඩ් (කෘතිම දැව, තුනීලෑලි) අලෙවි කිරීම
82. බිත්තර තොග ගබඩා කිරීම හා විකිණීම
83. විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
84. ගුවන් ටිකට් නිකුත් කරන කාර්යාලයක් පවත්වාගෙන යාම
85. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම (මහන මැෂින් 15කට වැඩි)
86. වතුර පොම්ප හා ජෙනරේටර් අලෙවිය
87. පාසැල් පොත් නිපදවීම හා බෙදා හැරීම
88. කොන්ත්‍රාත් ක්‍රමයට සේවකයින් කර්මාන්ත ශාලාවලට ලබාදීම
89. හිස්ගෝනි ගබඩාකර තබා ගැනීම
90. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හා විකිණීම
91. පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
92. කඩල විකිණීමේ කුටියක් පවත්වාගෙන යාම
93. සුරතල් මසුන් ඇතිකිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
94. පිටරටින් ගෙන්වන ලද නිමි ඇඳුම්, විදුලි උපකරණ තොග/සිල්ලරට අලෙවි කිරීම
95. රසායනික ද්‍රව්‍ය (කෘෂි රසායනික හා අනෙකුත්) අලෙවිකිරීම හා ගබඩා කිරීම
96. ආයුර්වේද බෙහෙත් බඩු ගබඩාවක් පවත්වාගෙන යාම
97. රසකැවිලි වර්ග පැකට් කිරීම හා විකිණීම
98. ඡායාරූප මුද්‍රණය (වර්ණ රසායනාගාරය)
99. තොග වශයෙන් රබර් ගබඩාවක් තබාගැනීම
100. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
101. විදුලි උපකරණවලට අදාල කොටස් නිෂ්පාදනය
102. ත්‍රීරෝද රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
103. ත්‍රී රෝද රථ අමතර කොටස් හිරු ආවරණ, දොර ආවරණ, නිෂ්පාදනය
104. ගොවි උපකරණ අලුත්වැඩියාව හා වෙළඳාම
105. පරිඝණක අන්තර්ජාලයට පිවිසීමේ පහසුකම් ලබාදෙන ස්ථානයක් පවත්වාගෙන යාම
106. (කේබල් ටී. වී.) රූපවාහිනී නාලිකා රැහැන් මගින් ලබාදීම
107. ශ්‍රමිකයන් කුලියට ලබාදීමේ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
108. රසායනික පොහොර ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109. කබොක් බොරළු හෝ කළුගල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. තොග වශයෙන් සිගරට් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
112. මත්පැන් තොග වශයෙන් ගබඩා කිරීම
113. අත්යන්ත්‍ර මාර්ගයෙන් රෙදි විවීම
114. පරිඝණක යන්ත්‍ර අලෙවි කිරීම
115. අලුත්වැඩියා කරන ලද යන්ත්‍ර සූත්‍ර පිටරටින් ආනයනය කිරීම (බැකෝ ලෝඩර් ඇතුලුව)
116. දුරකථන උපාංග අලෙවිය
117. දර ගබඩා කිරීම
118. ගෘහ භාණ්ඩ (ෆර්නිචර්) වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
119. අවමංගල්‍ය භාණ්ඩ වෙළඳාම් හා කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

III වන උපලේඛනය - (කර්මාන්ත බදු )

1. යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම
2. අත්යන්ත්‍ර මාර්ගයෙන් ෂීට් රබර් නිෂ්පාදනය කිරීම
3. කොහුවලින් හෝ වෙනත් කෙඳි වලින් සාදනු ලබන භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
4. රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම
5. විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පැවැත්වීම
6. මෝටර් වාහන සඳහා බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
7. කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
8. ජී. අයි. බාල්දි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
9. කෘතිම හෝ ස්වභාවික සම්වලින් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10. ග්‍රොස් 50කට වැඩි ප්‍රමාණයක් ගිනිපෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

11. තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12. පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
13. ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම
14. ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම
15. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම
16. බීරළු කැපීම සහ යන්ත්‍රානුසාරයෙන් ලී යතුගෑම
17. සාම්බ්‍රානි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. ලියවන පට්ටල් වැඩපලක් පවත්වාගෙන යාම
19. යන්ත්‍රානුසාරයෙන් රෙදි නිෂ්පාදනය කිරීම
20. ඇලුමිනියම් ආශ්‍රිත කර්මාන්තයක් පැවැත්වීම
21. ෆයිබග්ලාස් වැඩපලක් පවත්වාගෙන යාම
22. රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
23. ක්‍රේප් රබර් සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම

**සීතාවකපුර නගර සභාව**

*2012 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු/ව්‍යාපාර බදු/කර්මාන්ත බදු ගාස්තු ප්‍රමාණයන්*

| | | වාර්ෂික වටිනාකම රු. 3,500 දක්වා රු. | වාර්ෂික වටිනාකම රු. 3,501 රු. 5,000 දක්වා රු. | වාර්ෂික වටිනාකම රු. 5,001 රු. 7,500 දක්වා රු. | වාර්ෂික වටිනාකම රු. 7,501 රු. 10,000 දක්වා රු. | වාර්ෂික වටිනාකම රු. 10,001 රු. 15,000 දක්වා රු. | වාර්ෂික වටිනාකම රු. 15,001 රු. 25,000 දක්වා රු. | වාර්ෂික වටිනාකම රු. 25,001 ට වැඩි දක්වා රු. |
|---|---|---|---|---|---|---|---|---|
| (අ) | සංශෝධිත පනතේ 14 ජේදයේ අනුව සහ ප්‍රධාන ප්‍රඥප්තිය 164 වැනි වගන්තිය යටතේ පැනවෙන බලපත්‍ර ගත යුතු ව්‍යාපාර සඳහා වූ පොදු ගාස්තු ප්‍රමාණයන් (ගැසට් නිවේදනයේ උපලේඛන අංක 1 ට අදාළ ව්‍යාපාර ලැයිස්තු මෙයට අදාළ වේ. | 250 | 350 | 450 | 550 | 650 | 850 | 1,000 |
| (ආ) | සංශෝධිත පනතේ 15 ජේදයේ අනුව සහ ප්‍රධාන ප්‍රඥප්තිය 165 (අ) වැනි වගන්තිය ප්‍රකාර ව්‍යාපාර බදු/කර්මාන්ත බදු ගෙවිය යුතු ව්‍යාපාර සඳහා පොදු ගාස්තු ප්‍රමාණයන් (ගැසට් නිවේදනයේ උපලේඛන අංක 2, 3 ට අදාළ ව්‍යාපාර ලැයිස්තු මෙයට අදාළ වේ. | 250 | 350 | 550 | 750 | 1,000 | 1,000 | 1,000 |

*සංශෝධිත පනතේ 15 වන ජේදය අනුව සහ ප්‍රධාන ප්‍රඥප්තියේ 165 (ආ) වගන්තිය යටතේ පැනවෙන ව්‍යාපාර බදු :*

1. 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද හෝටලයක්, රෙස්ටුරන්ට් එකක් හෝ නවාතැන් පලක් වෙනුවෙන් අය කරනු ලබන බදු එක් හෝටලයකින්, රෙස්ටුරන්ට් එකකින් හෝ නවාතැන් පලෙන් පෙරාතුව ම වර්ෂයේ ලැබීම් වලින් 1% කට වැඩි නොවන බද්දක් අයකරනු ලැබේ.

2. නගර සභා ආඥාපනතේ 165 (ආ) වගන්තිය යටතේ පැනවෙන බදු බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ දී ලැබීම්වලට අනුකූලව හා පහත උපලේඛනයේ දැක්වෙන ප්‍රමාණයන් නොඉක්මවන පරිදි වේ.

| *ඉහතින් වූ වර්ෂයේ ලැබීම් රුපියල්* | *ගෙවිය යුතු වාර්ෂික බද්ද රුපියල්* |
|---|---|
| රු. 01 සිට රු. 6,000 දක්වා | නැත |
| රු. 6,001 සිට රු. 12,000 දක්වා | 90 |
| රු. 12,001 සිට රු.18,750 දක්වා | 180 |
| රු. 18,751 සිට රු. 75,000 දක්වා | 360 |
| රු. 75,001 සිට රු. 1,50,00 දක්වා | 1,200 |
| රු. 1,50,000 සිට ඉහළට | 3,000 |

*ඉහත බදු අදාළ වන ව්‍යාපාර :*

1. කොමිස් ඒජන්තවරු
2. වෙන්දේසිකරුවන්
3. බ්‍රෝකර්වරුන්
4. මුදල් ආයෝජකයන්
5. මුදල් ණයට දෙන්නන්
6. කොන්ත්‍රාත්කරුවන්
7. උකස් බඩු ගන්නවුන්
8. ගණන් පරීක්ෂකවරුන්
9. පෞද්ගලික අධ්‍යාපන පංති පවත්වන්නවුන්
10. ගෘහ නිර්මාණ ශිල්පීන්
11. සැපයුම්කරුවන්
12. රක්ෂණ නියෝජිතයින්
13. ප්‍රවාහන නියෝජිතයින්
14. කුලී කාර් අයිතිකරුවන්
15. සිනමාශාලා පවත්වන්නවුන්
16. මෝටර් රථ වෙළදාම් කරන්නවුන්
17. බැංකු රක්ෂණ සමාගම්

3. උපලේඛනයේ පනවා ඇති බදු මුදල් සම්බන්ධයෙන් ඉල්ලුම්පත්‍ර හෝ ආදායම් ප්‍රකාශන හෝ වාර්තා ලියවිලි ආදිය 2011 මාර්තු 31 දිනට පෙර ලේකම් වෙතට ඉදිරිපත් කළ යුතු අතර, එකී බදු මුදල් ගෙවන ලෙස දැනුම් දුන් දින සිට දින 30 ඇතුළත සභාවට ගෙවිය යුතු ය.

4. ව්‍යාපාර කීපයක් එකම වරිපනම් අංකයක වූ ගොඩනැගිල්ලක් හෝ දේපලක් තුළ පවත්වාගෙන යන අවස්ථාවල දී එම එක් ව්‍යාපාරයක් වෙනුවෙන් එකී ගොඩනැගිල්ලේ දේපළ වෙන්කර ඇති බිම් ප්‍රමාණය සැලැකිල්ලට ගත හැකි විට පමණක් ඒ ව්‍යාපාරය සඳහා යොදන ලද බිම් ප්‍රමාණයේ කොටස් කළ වාර්ෂික වටිනාකම අනුපාතිකය අනුව බලපත්‍ර ගාස්තුව ද ව්‍යාපාර බදු ද, කර්මාන්ත බදු ද තීරණය කිරීමේ බලය සභාව සතු වේ.

5. වරිපනම් අයකිරීමේ කාර්යය සඳහා ව්‍යාපාර ඒකකයක් වශයෙන් තක්සේරු කර නොමැති දේපළක් වෙනුවෙන් රු. 1,000ක් අයකරනු ලැබේ. සකස් කරන ලද ආහාර පාන පිටතට ගෙන යාම සඳහා වන වෙළඳ Take Away Food Center ස්ථාන වලින් අවම වශයෙන් රු. 750ක් අයකරනු ලැබේ.

*6. සංවර්ධන නොකළ ඉඩම්වලින් අය කෙරෙන බදු* :

යම් ඉඩමක් පහත සඳහන් කාර්යයන් සඳහා යොදාගෙන නොමැත්තේ නම් :

*(අ)* ඒ ඉඩමෙන් සත්‍ය වශයෙන් ම ගොඩනැගිල්ලට යට වී ඇති බිම් ප්‍රමාණය හා ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණය අතර ඇති අනුපාතය වඩා අඩු වේ නම්,

*(ආ)* ඉඩමේ ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැත්තේ නම්,

*(ඇ)* ස්ථාවර නැතහොත් නිතිපතා කරන ගොවිතැනට ඒ ඉඩම යොදවා නැත්නම් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක (2%) බද්දක්.

7. *ඉඩම් විකිණීම විෂයෙහි අය කෙරෙන බදු* : සභාවේ පාලන සීමාව තුළ පිහිටි ඉඩමක් වෙන්දේසිකරු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයෙකු නැතහොත් නියෝජිතයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් වෙනත් අකාරයකින් විකුණනු ලැබුවහොත් එම විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් මෙම බද්ද ගෙවීම අදාළ ඉඩම විකුණනු ලැබූ වර්ෂය අවසානයට පෙර ගෙවිය යුතු ය.

06-447

---

සංශෝධනයයි

**අගලවත්ත ප්‍රාදේශීය සභාව - මාර්ග ලේඛනය**

2012.02.03 වැනි දින අංක 1744 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටස පළාත් පාලනය යටතේ පිටු අංක 491 හි පළවූ මාර්ග සංශෝධනයේ පළමු ඡේදයෙහි සඳහන් පිටු අංක 1680 යන්න පිටු අංක 1689 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

චාමින්ද රණවක,
සභාපති,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2012 මැයි මස 22 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.
06-444

---

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පෞද්ගලික සුසාන භූමි ආඥාපනතෙහි 1 වැනි පරිච්ඡේදයේ 4 වන වගන්ති ප්‍රකාරව වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් වර්ෂ 2012 ක් වූ මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි පළාත් පාලන කොටසේ අංක 1752 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම අනුව කිසියම් පාර්ශවයක් කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් කරනු නොලැබ ඇති හෙයින්, යථෝක්ත *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ පොදු සුසාන භූමි ප්‍රාදේශීය සභාව සතු පොදු සුසාන භූමි වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

දේශබන්ධු පැට්‍රික් කරුණාසිංහ,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2012 මැයි මස 08 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය, බෝයගනේ.

06-224

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.